# ස්වයං අධ්‍යයනයට අත්වැලක්

ශ්‍රේණිය : 10

වාරය : දෙවන වාරය

නිපුණතා මට්ටම 5.3 : ශ්‍රී ලාංකේය ගැමි නාටක හා සබැඳි පසුබිම අධ්‍යයනය කර සුවිශේෂී ලක්ෂණ ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම 5.3.1 : **සොකරි ගැමි නාටකය පිළිබඳ තතු විමසා බලමු.**




සැකසුම : තනූජා රාජපක්ෂ.

මප/වත්/පාතදුම්බර මහා විද්‍යාලය,

වලල - මැණික්හින්න.


මෙහෙයවීම : කලාප අධ්‍යාපන කාර්යාලය,වත්තේගම.

උපදෙස් - මෙය ලිඛිත පාඩමකි.මෙම පාඩම වැඩිදුරටත් අධ්‍යයනය කිරීම සඳහා පාසලේ ගුරු ඇසුර ලබා ගත යුතුය.

හැඳින්වීම - දේශීය නාට්‍ය කලාවේ ආරම්භය පිළිබඳව විමසීමේදී ගැමි නාටක සුවිශේෂී වේ. ඒ අනුව සොකරි, කෝලම් නාඩගම්, රූකඩ ආදී ගැමි නාටක කිහිපයක් වේ.

මෙම පාඩමින් අප සූදානම් වන්නේ සොකරි ගැමි නාටකයේ කතා ප්‍රවෘත්තිය, ප්‍රචලිත ප්‍රදේශ, පැවැත්වීමේ අරමුණු, ගායන, වාදන, රංග වස්ත්‍ර හා රංග භාණ්ඩ ආදිය පිළිබඳව විස්තරාත්මක අවබෝධයක් ලබා ගැනීමටය.



# සොකරි ගැමි නාටකය

- ලංකාවේ පවත්නා පැරණිම ගැමි නාටකයයි.
- උඩරට නර්තන සම්ප්‍රදාය හා බැඳි ගැමි නාටක විශේෂයකි.
- විවිධ අරමුණු මුල් කොට ගනිමින් මෙම ගැමි නාටකය පවත්වයි.

## ප්‍රචලිත ප්‍රදේශ

* හඟුරන්කෙත
* නිල්දණ්ඩාහින්න
* බදුල්ල
* මාතලේ
* කොනකලගල
* උඩහේවාහැට
* හේනවල
* තලාතුඔය
*දඹුල්ලේ කළුන්දෑව

* තලාතුඔය
* බටුවත්ත
* උඩ පේරාදෙණිය
* කොටුවේගොඩ
* පාතහේවාහැට
* කපුලියද්ද
* ලග්ගල
* දික්පිටිය *
*හපුගන්දෙනිය



## පවත්වනු ලබන කාලය

- අස්වනු නෙලා ගැනීමෙන් පසුව එළඹෙන අප්‍රේල්, මැයි,ජූනි මාසවල

## අන්තර්ගත චරිත

### ප්‍රධාන චරිත

* සොකරිය (සොකරි අම්මා)
* ගුරුහාමි (ආඬිගුරු)
* පරයා (පච්චමීරා)
* තඹරාවිට වෙදරාල

### සෙසු චරිත

* සොත්තානා
* හෙට්ටියා
* චඩුරාල
* කපුරාල
* කාලි අම්මා

## පැවැත්වීමේ අරමුණු



## පුරාවෘත්ත කතාව

- ★ කසී දේශයෙහි ගුරුහාමි නමින් යුත් ආඩිගුරෙක් රූමත් යුවතියක වූ “සොකරි”නම් කාන්තාවක සරණපාවා ගනී.
- ★ විවාහ වී බොහෝ කලක් ගත වන තුරුත් දරු සම්පතක් නොලැබූ බැවින් කතරගම දෙවියන්ට බාරයක් ඔප්පු කිරීම සඳහා ඔවුහු ලක්දිවට පැමිණෙති.ඔවුන් සමඟ මෙහෙකරුවා වන පරයා සහ කාලි අම්මා ද ලක්දිවට පැමිණෙති.
- ★ පදිංචි වීමට ඉඩමක් සොයන අතරතුරේ දී තඹරාවිට නම් ගමෙහි ඔවුහු පදිංචි වෙති.
- ★ දිනක් ගුරුහාමි වතුර ගෙන ඒමට යෑමේ දී ගමේ වෙදරාළගේ බල්ලා ඔහුගේ කකුල සපා කයි. ඊට ප්‍රතිකාර කිරීම සඳහා වෙදරාළ පැමිණෙන්නේ සොකරිය පිළිබඳ ඇල්මකිනි.
- ★ ප්‍රතිකාර කිරීමෙන් පසු මැදියම් රැයේ දී වෙදරාළ සොකරිය සමඟ පලා යයි.කතරගම දෙවියන්ට කරන කන්නලව්වකින් පසු මග සලකුණු දැක වෙදරාළගේ නිවසේ සිටි සොකරිය ගුරුහාමි විසින් කැඳවාගෙන එනු ලබන්නීය.
- ★ කථාව අවසන් වන්නේ වෙදරාලට දාව සොකරියට දරුවකු ලැබීමෙනි.එහෙත් අවසානයේ ගුරුහාමි සොකරි සමග සාමදානයෙන් ජීවත් වෙයි.

## සොකරි නාටකයේ ප්‍රාදේශීය වෙනස්කම්

- ★ සොකරි නාටකයේ කතා පුවත ප්‍රාදේශීය වශයෙන් වෙනස්කම් සහිතය.
- ★ භාවිතා කරන වාද්‍ය භාණ්ඩයන්ගේ ප්‍රාදේශීය වෙනස්කම් ඇත.

මහනුවර ප්‍රදේශ වලදී - ගැටබෙරය

ඌව ප්‍රදේශ වලදී - දවුල

වන්නි ප්‍රදේශ වලදී - උඩැක්කිය

★ රංගනයට යොදා ගන්නා රංග භාණ්ඩයන්ගේ වෙනස්කම්

★ ඇඳුම් පැළඳුම්වල වෙනස්කම්

## සොකරි නාටකයේ වාදනය

- එක් එක් ප්‍රදේශ වශයෙන් වාද්‍යභාණ්ඩ භාවිතයේදී බොහෝ පළාත්වල උඩරට ගැටබෙරයද වන්නි පළාත්වල උඩැක්කියද, ඌව පළාත් වල දවුලද ප්‍රධාන වාද්‍යභාණ්ඩය ලෙස යොදාගනී.







- තාල වාද්‍ය භාණ්ඩය ලෙස පොදුවේ තාලම්පට යොදා ගනී.



- අතීතයේදී හොරණෑව වාදනය කලද වර්ථමානයේ හොරණෑ වාදකයකු නැත.
- මැඳුම් තනි තිතට අයත් බෙර පද වාදනය කරයි.
- නාටකයේ ආරම්භයේ සිට අවසානය තෙක් බහුලව " දොං ජිජිගත " යන බෙර පදය යොදා ගනී.
- කතා වස්තුව රඟ දැක්වීම සහ චරිත නරඹන්නාට හඳුන්වාදීම සඳහා සරල පද හා ගමන් තාල භාවිතා කරයි.

# සොකරි ගායනය

- සොකරි ගායනයට සුවිශේෂී තැනක් හිමි වේ.
- රඟ දක්වන සිද්ධිවල හා චරිතවල  ස්වභාවය හඳුන්වන්නේ කවි ගායනයෙනි.
- පොතේ ගුරුන්නාන්සේ ගයන සෑම පේළියක්ම අත්වැල් ගායකයෝ යළි ගයති.
- ආරම්භයේදී හා අතරමැදදී අනාඝාතාත්මක කවි ගයයි.

පෙර සම්මතේ  දී     - වනං දඹඅට බෙදී
දේශ දඹඅට සැ දී     - කසී දේශේ නමින් සුසැදී

- නාටකයේ චරිත රඟ බිමට ආරාධනා කිරීමේදී හා චරිත ස්වභාව හඳුන්වා දීමටද කවි යොදා ගනී.



## සොකරි නාටකයේ චරිත නිරූපනය

### ගුරුහාමි

- වයස්ගත පුද්ගලයෙකි.
- සිංහල බස කතා කිරීමට ඇති නොහැකියාව දෙබස් මඟින් ඉදිරිපත් කරයි.
- කවි ගයමින් රඟ මඩලට පිවිසේ.
- ගායනා වලට නටයි.
- දොං ජිජිගත බෙර පදයට අනුව රඟයි.
- බෙර පදයට හා කවියට රඟමින් වටේ යයි.



දේශේ සිට ආ ඒගුරු මහල්ලා

දියට යන්ට ලබු ගෙඩියක් එල්ලා

තඹරාවිට වෙදරාලගෙ බල්ලා

ගුරුවගෙ කකුලක් කාපි බොලල්ලා

### සොකරිය

- ප්‍රධාන කාන්තා චරිතයයි.
- රූමත් තරුණියකි.
- ගමන කලාත්මක මෙන්ම ලයාන්විතය.
- ශෘංගාරාත්මක රසයක් මතු වන ආකාරයෙන් දොං ජිජි ගත බෙර පදයේ තාලයට ගමනේ යෙදේ.
- ඇස් වලින් ඉඟි බිඟි පාමින් රංගනයේ යෙදීම සුවිශේෂී චරිත ලක්ෂණයකි.
- ලජ්ජාශීලී ස්ත්‍රියක් ලෙස රඟයි.



සොකරී එන්නී සබයෙන් අවසර ගන්නී
නැටුම් නටන්නී තාලෙට රාග කියන්නී
පද අල්ලන්නී පියයුරු ලැම සොලවන්නී
කැඩපත ගන්නී සුරතින් මූණ බලන්නී

## පරයා

- සොකරි සහ ආඬිගුරුගේ අතවැසියාය.
- මුකරි බසින් යුක්තය.
- ගුරුහාමී හා ප්‍රේක්ෂකයා සම්බන්ධ කරන අතරමැදි චරිතයයි.
- විකට ස්වරූපයකින් යුක්තය.
- ප්‍රේක්ෂකයාට හාස්‍ය රසයක් ලබා දෙමින් බෙර පදයට හා ගායනයට අනුව වටේට යයි.
- සොකරිය දෙස ගිජුබැලුම් හෙලයි.
- බෙර තාලයට උඩ පනිමින් අත පය විසි කරමින් හාස්‍ය ලෙස චරිත නිරූපනය කරයි.



ඉතින් කියන්නේ තුන්වෙනි වරට නටන්නේ
පරයා එන්නේ වට පිට නිතර බලන්නේ
කට දොඩවන්නේ ගිය ගිය තැන පෙරලෙන්නේ
කොක් හඬලන්නේ සොකරිය දෙසයි බලන්නේ

## වෙදරාල

- වයස්ගතන චරිතයකි.
- ස්ත්‍රීලෝලියකු ලෙසට චරිතය නිරූපනය කරයි.
- ඔහුගේ සල්ලාලකමත්,ප්‍රේක්ෂකයා සිනා ගන්නවමින් ඉදිරියේදී සිදුවිය හැකි දේ ගැන කිසියම් ඉඟියක් ලබා දෙමින් චරිත නිරූපනය කරයි.



වෙදා නටන්නේ සබයේ පැන පැන යන්නේ
යොදා කියන්නේ තාලෙට පද අල්ලන්නේ
කුදා වැනෙන්නේ සබයේ කොක්හඬලන්නේරු
විදා පාන්නේ අත් දෙක තැගී කියන්නේ

## රංග වස්ත්‍රාභරණ හා රංග භාණ්ඩ භාවිතය

### ගුරුහාමි

- උඩරට වෙස් නැට්ටුවකුගේ ඇඳුම ඇසුරෙන් නිර්මාණය කර ඇත.
- ඇඳුමේ පහළ කොටස හඟලට සමානය.
- ඉණට පච්චවඩමක් හා පයට සිලම්බු පලදී.
- තුන් පැත්තකට නරු තුනක් සිටින සේ හිසට මුණ්ඩාසනයක් පලදී.
- දැතේ, දෙපයේ, පපුවේ මෙන්ම නළලේ ද සුදු පාටින් ඉරි ඇඳ ඇත.

වමත සුරත නළලේ අළු ගාගෙන
දැත් දෙබැම තේ සෝරූ ද ගාගෙන
සිරිත ලෙසට ගඩු ගුඩාව ඇරගෙන
ගනිති නිමිති පොත අතකට අරගෙන

### සොකරිය

- උඩරට සාම්ප්‍රදායික ඔසරියකින් සැරසේ.
- අතට සහ පයට සිහින් ගෙජ්ජි ද, කරට ඇට මාල ද, කනට කරාබු ද, අතට වීදුරු වළලු ද පළඳී.
- පිරිමියකු සොකරියට රඟපාන බැවින් බොරු කොණ්ඩයක් පළඳී. කොණ්ඩය මල් වැලකින් සරසයි.
- නළල් පටියක් පළඳී.
- මල් පොකුරක් හෝ ලේන්සුවක් අතෙහි වේ.

### පරයා

- ඉරුණු ස්වරූපයෙන් යුතු කොට කලිසමක් හා කමිසයක් අඳී.
- කොළපතකින් සැකසූ වෙස්මුහුණක් පළඳී.
- හිසක කේතුවක ආකාරයට හිස් වැස්මක් පළඳී. ඇතැම් පළාත්වල මෙය කොළපතකින් සකසා ගොප්කොළ යොදා අලංකාර කරයි.
- අතේ දිග සැරයටියක් ද රෙදි වලින් මැසූ මල්ලක්ද වේ.

## වෙදරාළ

- කොණ්ඩය පිටුපසට බැඳ සිටින අතර, කණ්ණාඩියක් සහ දිගු රැවුලක් පැලඳ සිටී.
- කුදු බව පෙන්වීමට පිටට කොට්ටයක් බැඳ තිබේ.
- බඩ ඉදිරියට නෙරා ඇති බව පෙන්වීමට ද කොට්ටයක් බැඳ තිබේ.
- මේස් බැනියමක් ඇඳ ඊට උඩින් කෝට් කබායක් ද, සරමක් ඇඳ ඉණට පටියක් ද බඳී.
- අතට සැරයටියක් ගනී.

## සොත්තානා

- වෙදරාලගේ පුතා වන මොහු කුඩා දරුවකු මෙන් සරසා සිටී.
- කොට කලිසමක් හා බැණියමක් ඇඳ සිටී.
- කුඩා දරුවකුගේ ස්වරූපය ප්‍රදර්ශනය කරන කොළපතකින් සැකසූ වෙස් මුහුණක් පැළඳ සියී.
- සූප්පුවක් කර එල්ලා ඇති අතර වෙස් මුහුෙණෙහි කටට සූප්පුව තබාගෙන නර්තනය කරයි.



# සොකරි රංග භූමිය හා සැරසිලි

- කවාකාර රඟ මඬලකි.
- ගොයම් කපා පාගා අටසන් වූ කමත රංග භූමිය ලෙස යොදා ගනී
- රංගභූමිය මැද මූනින් අතට නවා තැබූ වංගෙඩියක් තබා ඇති අතර ඒ මත ලංතෑරුමක් දල්වා තබයි.
- බුදුන් වහන්සේ හා දෙවියන් වෙනුවෙන් තැනූ පහන් පැලක් රඟමඬල පසෙකින් වේ.






## ගැමි නාටක සංරක්ෂණය කරගැනීමට යෝජනා

සෑම වර්ෂයකට ම වරක් වත් පාසල් සිසුනට සහ මහජනතාවට රස විඳීම සඳහා එම ගැමි නාටක රඟ දක්වමින් සන්දර්ශන පැවැත්වීම

ගැමි නාටක කලාව පිළිබඳ ව ග්‍රන්ථ රචනා කිරීම

ගැමි නාටක රඟ දක්වන අවස්ථා රූ ගත කොට ශ්‍රව්‍ය දෘශ්‍ය පට සම්පාදනය කිරීම.

ගැමි නාටක වල ඇති වටිනාකම අගයමින් පුවත්පත් සඳහා ලිපි සකස් කිරීම.

රූපවාහිනිය,ගුවන්විදුලිය වැනි ජන මාධ්‍ය මඟින් සිංහල ගැමි නාටක කලාව පිළිබඳ වැඩසටහන් නිර්මාණය කර විකාශනය කිරීම.